(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 7]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 ජුලි මස 09 වැනි බදාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0015/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— ඛණිජ තෙල් සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ (CPC) හි මුළු නිෂ්පාදන ධාරිතාව කොපමණද;

(ii) එහි නිපදවනු ලබන සියලු නිෂ්පාදන කවරේද;

(iii) ඒවායේ නිෂ්පාදන වියදම හා දළ ලාභය සහ පරිපාලනය, බෙදා හැරීම හා අලෙවිකරණය ආශ්‍රිත වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) ඉහත සඳහන් නිෂ්පාදනවල විකිණුම් මිල ගණන් සහ වැඩි කරන ලද ලාභ ආන්තිකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියලු නිෂ්පාදන ආනයනය කිරීමේදී, නිෂ්පාදනය කිරීමේදී හා විකිණීමේදී ලංකා ඛණිජ තෙල් සංස්ථාව යටත් වන සියලු බදු වර්ග කවරේද;

(ii) ලංකා ඛණිජ තෙල් සංස්ථාව මගින් එබඳු නිෂ්පාදන නිපදවනු නොලැබුයේ නම්, ඒවායේ ආනයන හා අලෙවි වියදම් කවරේද;

(iii) ලංකා ඛණිජ තෙල් සංස්ථාව සහ වෙනත් ආශ්‍රිත සමාගම් විසින් සේවයේ යොදවනු ලබන මුළු ශ්‍රමිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) පසුගිය වර්ෂ 4-5 කාලය තුළ සමාගම් සමූහයක් ලෙස ලංකා ඛණිජ තෙල් සංස්ථාව ලැබූ ලාභය හෝ පාඩුව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0016/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය ජනනය කරන සමස්ත විදුලි බලය ප්‍රමාණය, තාප විදුලි බලය සහ ජල විදුලි බලය ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය සහ පෞද්ගලික අංශය විදුලි බලය ජනනය කිරීමේ ස්ථාන පිළිබඳව දරන හිමිකම් පිළිබඳ ලැයිස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) උපරිම ධාරිතාවයද සමඟ, ඉහත ව්‍යාපෘති සම්පූර්ණ කරන ලද දිනයන් කවරේද; සහ

(iv) ඉහත සියලු ව්‍යාපෘතිවල සමස්ත මෙහෙයුම් පිරිවැය සහ කාර්ය පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලක්ධානි හට අයත් කෙරවලපිටිය බලාගාරයෙහි විදුලි බලය ජනනය කිරීමේ පිරිවැය සඳහා සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හෝ එම අරමුදල් දෙකම මූල්‍ය සම්පාදනය කර තිබේද;

(ii) එසේ නම්, වියදම් කරන ලද මුදල කොපමණද;

(iii) එය නීත්‍යානුකූල වන්නේද; සහ

(iv) අපේක්ෂිත ලාභාංශ, කාල සීමාව ද සමග කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ හෝ ලක්ධානි හි, සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල විසින් මූල්‍ය සම්පාදනය කරන ලද වෙනත් කවර හෝ ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, ඉහත (ආ) පරිදි විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0017/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහා බැංකුව ස්ථාපනය කරන ලද දින සිට මෙරට අයහපත්ම උද්ධමන අනුපාතය පැවති (අවම වශයෙන් මාස තුනක අඛණ්ඩ කාලයක් කාලපරිච්ඡේදයක් ලෙස සලකා) කාල පරිච්ඡෙද තුන කවරේද;

(ii) ඒවායේ උද්ධමන අනුපාතය කවරේද; සහ

(iii) එම තත්ත්වයන් යහපත් අතට හැරවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එබඳු ඉහළ උද්ධමන ප්‍රවණතාවයක් ඇතිවීමට හේතු කවරේද; සහ

(ii) එබඳු ඉහළ උද්ධමන ප්‍රවණතාවන් කරා යාමෙන් ජාතික ආර්ථිකයට ඇති වන බලපෑම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම කාලපරිච්ඡේද තුළදීම ඉන්දියාව, පකිස්ථානය, තායිලන්තය, සිංගප්පූරුව සහ ඩුබායි හි ඇතිවූ උද්ධමන ප්‍රවණතාවයන්වල සංසන්දනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0326/'08

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) එම ආයතන පිහිටා ඇත්තේ කවර ස්ථානවලද;

(iii) එම ආයතන පිහිටා ඇති ගොඩනැගිලි රජයට අයත්වේද නැතහොත් පෞද්ගලික අයිතිකරුවන්ට අයත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික අයිතිකරුවන් සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යන ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(iii) අදාළ ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0327/'08

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලකද, නොඑසේ නම් පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලකද;

(ii) පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලක නම්, එහි අයිතිකරුගේ නම කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන කවරේද;

(ii) එම ආයතන පිහිටා ඇත්තේ කවර ස්ථානවලද;

(iii) එම ආයතන පිහිටා ඇති ගොඩනැගිලි රජයට අයත්වේද නැතහොත් පෞද්ගලික අයිතිකරුවන්ට අයත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෞද්ගලික අයිතිකරුවන් සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යන ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(iii) අදාළ ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0329/’08

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලකද, නොඑසේ නම් පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලකද;

(ii) පෞද්ගලික අයිතිකරුවෙකු සතු ගොඩනැගිල්ලක නම්, එහි අයිතිකරුගේ නම කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන කවරේද;

(ii) එම ආයතන පිහිටා ඇත්තේ කවර ස්ථානවලද;

(iii) එම ආයතන පිහිටා ඇති ගොඩනැගිලි රජයට අයත්වේද නැතහොත් පෞද්ගලික අයිතිකරුවන්ට අයත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෞද්ගලික අයිතිකරුවන් සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යන ආයතන කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(iii) අදාළ ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය සහ මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0384/’08

7.

ගරු අචල ජාගොඩගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේනම්, එම එක් එක් ආයතන සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිරකර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0385/'08

8.

ගරු අචල ජාගොඩගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ වාරිමාර්ග හා ජලකළමනාකරණ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(අ) (i) එසේනම්, එම එක් එක් ආයතන සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිරකර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0386/'08

9.

ගරු අචල ජාගොඩගේ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමියගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(අ) (i) එසේනම්, එම එක් එක් ආයතන සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිරකර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'08

10.

ගරු ජේමසිරි මානගේ මහතා,—පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනන්වල කැබලිපොල මාර්ගය එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය සංවර්ධනය කිරීමට කොපමණ මුදලක් වෙන්කර තිබේද;

(ii) එම මාර්ගයේ දිග හා පළල කොපමණද; සහ

(iii) මෙම මාර්ගයට අදාළ ඇස්තමේන්තු සකස් කළ පාර්ශ්වයන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0434/'08

11.

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වසර තුළ හා 2007 වසරේ අප්‍රේල් මස 30 වැනි දින දක්වා කාලය තුළ Liverpool Navigation Private Limited යන සමාගමට අයත් නැව්, පිළිවෙළින් ගමනාරම්භය හා ගමනාන්තය අනුව උතුරු ප්‍රදේශයට භාණ්ඩ ප්‍රවාහනය කර තිබෙන වාර ගණන කොපමණද;

(ii) ඉහත කී නැව් සමාගම ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි නැව් සමාගමක් වන්නේද;

(iii) එහි හිමිකරු, සභාපති හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iv) එලෙස උතුරු ප්‍රදේශය සඳහා එම සමාගම මගින් භාණ්ඩ ප්‍රවාහනයට යෙදවූ නැව්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත වර්ෂ තුළ එම නැව් මගින් ප්‍රවාහනය කළ භාණ්ඩ ප්‍රමාණය, එක් එක් භාණ්ඩ වර්ග හා ප්‍රවාහනය කළ නැව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස භාණ්ඩ ප්‍රවාහනයේදී නැව්වල කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කළ අයගේ සම්පූර්ණ නම, තනතුර, ස්ථිර ලිපිනය, සේවය කළ නැවේ නම හා නැවෙහි සේවා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'08

12.

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වසර තුළ අපනයනය හා ආනයනය කරන ලද එළවළු, පළතුරු, ධාන්‍ය හා කුළුබඩු ප්‍රමාණයන් හා ඒවායේ උපවර්ග ප්‍රමාණයන් කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ වියදම හා ඉපයූ ආදායම ඇමරිකානු ඩොලර් හා රුපියල් වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධව කටයුතු කළ ආනයනකරුවන් හා අපනයනකරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ ආයතනයන්හි නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආහාර වර්ග දේශීයව නිෂ්පාදනය කරන නිෂ්පාදකයන්ගේ නම, අදාළ ආයතනය, ලිපිනය හා දුරකථන අංක කවරේද;

(ii) එම ආහාර වර්ග නිෂ්පාදනය කර විදේශ විනිමය ඉතිරි කර ගැනීමට රජය සතු ක්‍රමවත් වැඩපිළිවෙලක් තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 4.30 දක්වාද විය යුතු ය. අ.භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උසස් නිලතල පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 128 (අ) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 මාර්තු මස 14 වැනි දින අංක 1540/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත පනත යටතේ නියෝගය (අංක 1),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 24ඈ(2) වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය (අංක 2),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 23(1) (ඇ) වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය (අංක 3),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් මුද්දර ගාස්තු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආර්ථික සේවා ගාස්තු පනත යටතේ නියෝගය,— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආර්ථික සේවා ගාස්තු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා වූ අත්තිකාරම් ගිණුම" රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 53,00,000 සිට රු. 49,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.02.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 " රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 140,000,000 සිට රු. 275,000,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 " රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 4,50,00,000 සිට<br>රු. 13,50,00,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 38 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 38 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 01602 "අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිසම — අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම " දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 30,00,000<br>65,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 8,00,000<br>20,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.30 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 13 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 13 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 23202 “බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම” බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 6,50,00,000<br>7,50,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 6,60,00,000<br>7,60,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 3,00,00,000<br>3,10,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.05 වැනි දින,

කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 39 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 39 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය " අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,39,84,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,26,40,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 60,00,00,000<br>රු. 80,00,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 15,00,00,000<br>රු. 1,49,00,00,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.16 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙත පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

මෙම නියමයන් වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි.

# උපලේඛනය

2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2007 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළයුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| 1. | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | 1,225,000,000 | 1,145,000,000 | 698,160,000 | 663,160,000 | 3,150,000,000 | 2,918,000,000 | 1 |
| 2. | ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා | 10301 | 42,000,000 | 122,000,000 | 17,880,000 | 52,880,000 | 150,000,000 | 390,000,000 | 2 |
| 3. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | - | - | - | - | 70,000,000 | 135,000,000 | 5 |
| 4. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය | 26401 | - | - | 15,720,000 | 14,000,000 | - | - | 6 |
| 5. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 97,320,000 | 86,000,000 | - | - | 7 |
| 6. | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා | 15501 | - | - | 6,120,000 | 1,500,000 | - | - | 8 |
| 7. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28301 | - | - | 28,920,000 | 23,100,000 | - | - | 9 |
| 8. | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා | 15301 | - | - | 840,000 | 5,600,000 | 14,000,000 | 25,962,000 | 10 |
| 9. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28901 | - | - | 13,560,000 | 13,200,000 | - | - | 11 |
| 10. | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | - | - | 516,000,000 | 475,000,000 | - | - | 12 |
| 11. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 26101 | - | - | 44,520,000 | 33,000,000 | - | - | 14 |
| 12. | ශ්‍රී ලංකා යුද හමුදාව | 22201 | - | - | 921,000,000 | 800,000,000 | - | - | 15 |
| 13. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | - | - | 1,765,000,000 | 1,865,000,000 | 16 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 14. | මැනුම් දෙපාර්තමේන්තුව | 28801 | - | - | 78,120,000 | 72,000,000 | - | - | 17 |
| 15. | තරුණ කටයුතු අමාත්‍යවරයා | 15601 | - | - | - | - | 6,000,000 | 18,000,000 | 18 |
| 16. | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 663,160,000 | 600,000,000 | - | - | 19 |
| 17. | ස්වදේශ කටයුතු අමාත්‍යවරයා | 14701 | - | - | - | - | 8,000,000 | 12,000,000 | 20 |
| 18. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | 27401 | - | - | 31,920,000 | 25,000,000 | - | - | 21 |
| 19. | ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යවරයා | 13101 | - | - | 1,000,000 | 200,000 | - | - | 22 |
| 20. | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | 208,920,000 | 150,000,000 | - | - | 23 |
| 21. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | - | - | 65,000,000 | 129,000,000 | 24 |
| 22. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | 30,780,000 | 29,000,000 | - | - | 25 |
| 23. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 30001 | - | - | 8,400,000 | 7,000,000 | - | - | 27 |
| 24. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 235,560,000 | 220,000,000 | - | - | 28 |
| 25. | වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | - | - | 4,000,000 | 6,500,000 | 29 |
| 26. | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යවරයා | 15901 | - | - | - | - | 50,000,000 | 65,000,000 | 30 |
| 27. | පොල් සංවර්ධන අමාත්‍යවරයා | 14101 | - | - | 840,000 | 500,000 | - | - | 31 |
| 28. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | - | - | 192,000 | 96,000 | - | - | 32 |

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*15.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 160,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දහඅට කෝටි අසූ ලක්ෂයකට(රු.188,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය 160 — | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 02 — | සංවර්ධන ක්‍රියාකාරකම් | | |
| ව්‍යාපෘතිය 3(24) — | වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 188,000,000 |
| | මුළු වියදම | රු. | 188,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජුනි මස 05 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*16.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 160,— වැඩසටහන 01,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එකසිය තිහකට (රු. 130,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය 160 — | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 01 — | මෙහෙයුම් | | |
| ව්‍යාපෘතිය 02 — | පරිපාලනමය සහ ආයතනික කටයුතු | | |
| වැය විෂය 2104 — | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 12,700,000 |
| | මුළු වියදම | රු. | 12,700,000 |

| | | | |
|---|---|---|---|
| වැය විෂය 2105 — | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 117,300,000 |
| | මුළු වියදම | රු. | 117,300,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූනි මස 20 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 188,000,000.

*17.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*18.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*25.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*26.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*27.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*28.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*29.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 09 වැනි දින 1531/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*31.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද " 2008 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*33.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*34.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*35.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ නිවේදනය,— 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ කොන්සියුලර් සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2007 ජූනි මස 11 වැනි දින හා අංක 1501/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008. 02. 05 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*36.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*37.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*38.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා

කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*39.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*40.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*41.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*42.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වන දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*43.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වන දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

44.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

47.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

“ පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---